**ශීර්ෂය - 223 ශ්‍රී ලංකා නාවික හමුදාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **SA -**70 දරන භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව අග්‍රිම ලැබීම් වටිනාකම රු.55,119,766,551 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 50,521,170,364 ක් වී තිබුණි. ඒ අනුව රු.4,598,596,187 ක වෙනසක් නිරීක්ෂණය විය. | කේත අංක වෙනස්වීම නිසා මෙම වෙනස ඇතිවී ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපතේ වටිනාකම ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ වටිනාකම හා සමාන විය යුතු බව**.** |
| (ආ) | **SA-**70 දරන භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව අග්‍රිම පියවීම් වටිනාකම රු.55,116,691,101 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 55,129,866,509 ක් වී තිබුණි. ඒ අනුව රු.13,175,408 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ සිට එම අතපසු වීම් මගහරවා ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | -එම- |
| (ඇ) | **SA-**71 දරන භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම වටිනාකම රු.52,544,883,159 ක් වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම වටිනාකම රු. 47,946,286,972 ක් වී තිබුණි. ඒ අනුව රු. 4,598,596,187 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුම්ගත කිරීමේ දි ඇති වූ එම වරද නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | -එම- |

### 1.6.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගබඩා අත්තිකාරම් ගිණුමේ දේශීය ආදායම් කොමසාරිස් වෙත වැට් බදු ගෙවීම් වෙනුවෙන් දක්වා තිබූ තොරතුරු අනුව **2021** වර්ෂයට අදාල සමස්ථ විකුණුම් වටිනාකම (වැට්බදු රහිත) රු.**635,253,052** ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් විකුණුම් | මාසිකව සිදු කරන ලද විකුණුම් මෙන්ම විකුණුම් වෙනුවෙන් ලද අත්තිකාරම් ද විකුණුම් වූ පසු ගැලපුම් කර විකුණුම් වටිනාකම ගිණුම් ගත කර ඇත. | විකුණුම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව**.** |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම (වැට්බදු රහිත) රු.**644,397,173** ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල විකුණුම් වටිනාකම රු. **9,144,120** ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | ගබඩා අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් මාසයට අදාල විකුණුම් වටිනාකම රු.55,063,010 ක් වන අතර ඊට අදාල ගැලපීම් කිරීමෙන් පසු 2022 ජනවාරි මාසයේ විකුණුම් වෙනුවෙන් ගෙවා තිබූ වැට්බදු වටිනාකම රු.1,282,885 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල එම බදු බැරකම හෙලිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු වැට් බදු වටිනාකම වූ රු.3,155,443.29 තුල ජනවාරි මාසයේ ගෙවා තිබූ රු.1,282,885 ක වැට් බදු වටිනාකම ද ඇතුළත් කර ඇත. | නියමිත කාලයට අදාළ බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බව. |
| (ඇ) | මිළදී ගැනීමේ අපේක්ෂාවන් ගබඩාව වෙත ගැණුම්කරුවන් ලබා දී තිබූ අත්තිකාරම් වටිනාකම 2021 දෙසැම්බර් 31 දිනට රු.53,283,813 ක් විය. එම වටිනාකම තුල වර්ෂ 05ක් ඉක්මවා ලබා දී තිබූ අත්තිකාරම් වටිනාකම රු.1,467,799 ක් විය. ඊට අමතරව අත්තිකාරම් ලැබී මාස 03 ක් ඉක්ම වූ වටිනාකම රු. 39,075,014 ක් විය. ඉහත අත්තිකාරම් ලැබීම් විකුණුම් කිරීමේ දී හිලව් කිරීමට හෝ ගැණුම්කරුවන් වෙත විධිමත් පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මිලදී ගැනීම් ක්‍රියාවලියේ පවතින නීතිමය ගැටළු හා ආනයනය කිරීමේදී මාස 03 ඉක්මවා කාලය ගතවීම මේ සඳහා හේතුවී තිබුණි. | විධිමත් පරිදි නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ගබඩා අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට තත්ත්ව පරීක්ෂණ ගාස්තු වටිනාකම රු. 86,000 ක් වුව ද එදිනට ලෙජරය අනුව එහි වටිනාකම රු. 2,066,475 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයේ හා ලෙජරයේ සඳහන් වටිනාකම්වල රු. 1,980,475 ක වෙනසක් නිරීක්ෂණය කෙරේ. | අතපසු වීමකින් තැරව් ගාස්තු තත්ත්ව පරීක්ෂණ ගාස්තු ලෙස ලෙජරයෙහි සටහන් කර ඇතත් ගිණුම්ගත කිරීමේදී නිවැරදිව සටහන් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල හා ලෙජරයේ වටිනාකම් සමාන විය යුතු බව. |

### 1.6.3 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය වන භාණ්ඩාගාර මුද්‍රිත **SA** 82 අනුව 2021 වර්ෂය තුළ මූලධන වත්කම් අත්පත් කර ගැනීම රු.1,462,396,608 ක් වුවද මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත්කර ගැනීම රු.1,466,477,733 ක් ලෙස දක්වා තිබීමෙන් රු.4,081,125 ක වෙනසක් නිරීක්ෂණය විය. | සමාලෝචිත වර්ෂයේ අත්පත් කර ගත් නමුත් නිවැරදිව ලේඛනගත නොවූ වත්කම් ඉදිරියේ දී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත වටිනාකම හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අතර වටිනාකම එකිනෙක හා සමාන විය යුතු බව. |

### 1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ එකතුව හා පාලන ගිණුමේ ශේෂය සැසඳීමේදී රු. 21,625,626 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත කපාහැරීම සඳහා යෝජනා වුවද ඊට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ඉටුවී නොතිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශය මඟින් මෙම වෙනස ඇති වූ ආකාරය සොයා බැලීම හා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට පරීක්ෂණ කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. | කපාහැරීම සඳහාවූ ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු බව. |

### 1.6.5 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට පැවති රු. 13,175,408 ක නොපියවූ උප අග්‍රිම වටිනාකම හා රු. 32,640,758 ක නොපියවූ අග්‍රිම වටිනාකම භාණ්ඩාගාරය වෙත පියවූ ආකාරය (වියදම් මගින්/ මුදල් මගින්) පිළිබඳව ඒසීඒ 3 ආකෘතියෙහි සඳහන් කර නොතිබුණි. | මෙවැනි අතපසු වීම් ඉදිරියට සිදු නොවීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | අදාළ ආකෘතීන් අනුව සටහන් කර වාර්තා කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ප්‍රතිපාදන උපයෝජනය

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් පිළියෙල කර නොතිබුණු පුනරාවර්තන වැය විෂයක්ද ඇතුළුව වැය විෂයන් 09ක් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් රු.1,335,024,500 ක් ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණි. | අනපේක්ෂිත වියදම් පියවා ගැනීම සඳහා මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමට කටයුතු කර ඇත. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 01 ක් සඳහා වෙන්කරගත් ප්‍රතිපාදනය වූ රු.69,300,000 ක සම්පූර්ණ මුදලම වර්ෂය අවසාන වන විටත් ඉතිරිව පැවතුණි. ඒ අනුව අදාල මුදල් වෙන්කර ගැනීමේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | රජය විසින් ගනු ලැබූ පියවර හේතුවෙන් මෙම වැය විෂයන්ගේ සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදු වී ඇත. | වෙන්කරගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා කටයුතු කළ යුතු බව. |
| (ඇ) | 2020 අංක 07 දරණ විසර්ජන පනතේ 6(1) උප වගන්තිය ප්‍රකාර පළමු උපලේඛණයේ ජාතික අයවැය දෙපාර්තමේන්තු වැය ශීර්ෂ 240 සංවර්ධන වැඩසටහන යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපාතිය විසින් වැය ශීර්ෂ 223 ශ්‍රී ලංකා නාවික හමුදාව වෙනුවෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ආපසු පියවා තිබුණි. වැය විෂය 2101 වාහන අත්පත් කර ගැනිම සඳහා බල අංක 175 දරන පරිපූරක ඇස්තමේන්තුවෙන් ලද ප්‍රතිපාදන මුදල වන රු. මිලියන 3,685 ක මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබූ අතර මුළු ප්‍රතිපාදනයම ආපසු පියවා තිබුණි. 2021 දෙසැම්බර් 30 දින බල අංක 175 අවලංගු කර ඒ වන විට ඇති කරගත් බැදීම් වෙනුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම අවශ්‍ය ප්‍රතිපාදන බල අංක 1063 යටතේ සලසා ගෙන තිබුණි. | ඉතිරි වූ ප්‍රතිපාදන රටේ වෙනත් සංවර්ධන කටයුත්තකට දායක කර ගැනීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කරනු ඇත. | ලබාගත් ප්‍රතිපාදන හැකිතාක් මුළුමනින්ම උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ඈ) | වැය විෂයය 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනිම වෙනුවෙන් බල අංක 175 දරන පරිපූරක ඇස්තමේන්තුවෙන් රු. මිලියන 3,842.26 ක් ප්‍රතිපාදනය කරගෙන තිබුණු අතර එයින් උපයෝජනය කර තිබුණේ මිලියන 43.03 ක් පමණි. මිලියන 3,799.23 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. මෙලෙස ඉතිරි වූ ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත පියවීමෙන් පසු අංක 175 දරණ බල අංකය අවලංගු කර ඒ වන විට ඇතිකරගෙන තිබූ බැදීම් වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන බල අංක 1063 යටතේ රු.මිලියන 1,427.26 ක් වෙන් කරගත් නමුත් එයින් වැය වූ මුදල රු.මිලියන 43.03 ක් වීම හේතුවෙන් ඉතිරිවීම් මිලියන 1,384.23 ක් විය. ලද ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් උපයෝජනය වී නොතිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන රටේ වෙනත් සංවර්ධන කටයුත්තකට දායක කර ගැනීම සඳහා නැවත ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පුනරාවර්තන වැය විෂයන් 02ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදනය කල මුදල රු.100,000,000 විය. එම මුදල් සම්පූර්ණයෙන්ම උපයෝජනය වී නොතිබුණ අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ආපසු පියවා තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය නොවීමක් සිදු වී නොමැත. | -එම- |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බැඳීමට එළඹී සියලුම බැඳීම් හා බැරකම් සටහන **(iii)** යටතේ දැක්විය යුතු වුවද 2022 වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් සම්බන්ධ වවුචර් පරික්ෂාවේදී රු. 22,592,030 ක් වටිනා වවුචර් 19 ක් බැරකම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේ දී මෙම අතපසු වීම් සිදු නොවීමට අදාල අංශ දැනුවත් කර ඇත. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු බව**.** |
| (ආ) | බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබූ වටිනාකම රු.4,092,757 ක්වූ සමාලෝචිත වර්ෂයට අදාළ බැඳීම් හා බැරකම් 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවා තිබුණි. | මේ පිළිබඳ වගකිව යුතු අංශ දැනුවත් කර නිවැරදි බැඳීම් හා බැරකම් ප්‍රකාශයක් ඉදිරියේදී ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ඇත. | අදාළ වර්ෂයට අදාළ බැඳීම් හා බැරකම් එම වර්ෂය තුළදීම නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව**.** |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස නාවික හමුදාවට ප්‍රදානය කරනලද මුළු ප්‍රතිපාදනය රු**.**637,879,410 ක්වූ අතර සත්‍ය වියදම රු**.**402,986,455 ක් වී තිබුණි. ඒ අනුව උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදනය සියයට **59** ක් විය. | අක්මුදල් ප්‍රමාණවත්ව නොලැබීම නිසා නියමිත දිනට වවුචර්පත් පියවීමට නොහැකි වීම හේතුවෙන් මෙම වෙනස හටගෙන ඇත. | ප්‍රතිපාදන හැකි උපරිම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව**.** |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) | නිලධාරියාගේ නමට අත්තිකාරම් නිකුත් කිරීම වෙනුවට තනතුරු නාමයට හෝ අංශයට නිකුත් කර තිබුණි. | මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් නිකුත් කල යුතු බව දන්වා ඇත. | නීති රීති හා රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතු බව. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ) | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම නිරවුල් කළ යුතු වුවද ඉන් බැහැරව නිරවුල් කිරීම සඳහා දින 09 සිට දින 100 දක්වාවූ කාල ප්‍රමාදයක් තිබුණි. | අත්තිකාරම් ලබා ගන්නා වගකිව යුතු නිලධාරීන් හට උපදෙස් ලබා දීමට කටයුතු කරනු ඇත. | -එම- |
| (iii) මුදල් රෙගුලාසි 371 (4) | ගණන් දීමේ නිලධාරියා වුවද නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුවද අවස්ථා 23 කදී ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම මුදල සම්පූර්ණයෙන් හෝ වැඩි කොටසක් නැවතත් මුදලින් පියවා තිබුණි. එමෙන්ම අදාළ මුදල් නිෂ්කාර්යව පැවති කාලසීමාව දින 06 සිට මාස 09 ක් දක්වා වී තිබුණි. | තත්කාර්ය අග්‍රිමයන් නිකුත් කිරීම හා පියවීම විෂමතා ඇති නොවන පරිදි නිසි ක්‍රමවේදයකට අනුව ක්‍රියාත්මක කිරීම සඳහා අදාල බලධාරීන් දැනුවත් කර ඇත. | -එම- |
| (iv) මුදල් රෙගුලාසි 504 | වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යන අවස්ථාවක එක් එක් කාර්තුවක් අවසානයේදී වෙළඳ ණයහිමියන් ,තොග හා බඩු බාහිරාදිය පිළිබඳ මාසික පරීක්ෂණ වාර්තා, අවස්ථානුකූලව | කාර්තු ගිණුම් ප්‍රකාශ මේ වන විටත් පිළියෙල කර ඇති අතර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | ලාභාලාභ ගිණුම හා මාසික ගිණුම් සාරාංශය පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව 9ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (v) | මුදල් රෙගුලාසි 507 | එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොගවල අගය වාර්ෂික ගිණුම්වලට ඇතුළත් කිරීමේ කාර්යයන් සඳහා තොග භෞතික සත්‍යාපන පිරික්සුමකට භාජනය කළ යුතු වේ. එම තොග සත්‍යාපන සමීක්ෂණ මණ්ඩල වාර්තා ගිණුම් ප්‍රකාශ සමග විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද ගබඩා අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු. 137,844,869 ක්වූ තොගය සත්‍යාපනය කළ සමීක්ෂණ මණ්ඩල වාර්තා ගිණුම් සමග විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිරියට අවසන් ගිණුම් ප්‍රකාශ සමඟ තොග සත්‍යාපන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | -එම- |
| **(ආ)** | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ | මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම පිළිබඳ සටහනක් මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ පදනම යටතේ ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී එම අතපසු වීම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

## 2.5 තැන්පත් ශේෂයන්

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------------------------- | ------------------------------ |
| උතුරු මැද නාවික විධානයට අයත් ගිණුම් අංක 7041349 යටතේ කාලය ඉක්මවූ රාජ්‍ය ආදායමට බැර නොකළ පොදු තැන්පත් ගිණුම් ශේෂය රු.218,518 ක්වූ අතර ඉක්මවූ කාලය මාස 24 ක සිට 58 ක පරාසයක විය. | රාජ්‍ය ආදායමට බැර නොකල පොදු තැන්පතු ශේෂය 2022 මාර්තු මාසයේ දී නිරවුල් කර ඇත. | කාලය ඉකුත්වී ඇති ආදායම් රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කළ යුතු බව. |

## 2.6 අග්‍රිම ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගොස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 2.4 ඡේදය අනුව හා මුදල් රෙගුලාසි 371 සංශෝධනය කිරීමෙහි 371 (5) වගන්තිය ප්‍රකාරව කවර අන්දමේ අතුරු අග්‍රිමයක් වුවද එම අග්‍රිමය නැවත පියවීමේදී එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට කිසිදු කොටසක් රඳවා ගත යුතු නොවන බවට දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.3,075,450 ක නොපියවූ උප අග්‍රිම ශේෂයක් තිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව ලබා දුන් රු.3,075,450 ක තත්කාර්ය අතුරු අග්‍රිමය 2021 වර්ෂයේ දී නිරවුල් නොකර 2022 මුදල් වර්ෂය සඳහා රැගෙන යාමට සිදු වන බව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතු බව. |

## 2.7 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වර්ෂ 05 ඉක්මවූ අයවීමට ඇති වෙනත් ණය ශේෂ, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂය පිළිවෙලින් රු. 18,180,159 ක් , රු. 673,693 ක් හා රු. 481,754 ක් වී තිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශයෙන් පත් කල නව කමිටුවක් හරහා වෙනත් ණය ශේෂ අයකර ගැනීමට අදාලව පරීක්ෂා කරමින් පවතින අතර සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා අදාල සිහි කැඳවීම් ලිපි නිකුත් කර ඇත.<br><br>තවද විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනාට විරුද්ධව පවතින පරීක්ෂණ මණ්ඩල වාර්තා අවසන් නොමැති බැවින් ගිණුමේ අයවීමට නියමිත ශේෂ ලෙස තවදුරටත් පෙන්වීමට සිදු වී ඇත. | රජයට අයවීමට ඇති ණය ශේෂ කඩිනමින් අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජයේ දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ වලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂය රු. **105,959** ක් වී තිබූ අතර අය නොවී තිබූ කාලය වර්ෂ **04** ද ඉක්මවා තිබුණි. | පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනාගේ ණය ශේෂ මාසික වැටුපෙන් වාරික වශයෙන් අයවෙමින් පවතී. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන නොලැබීම හා ණයවර ලිපි විවෘත කිරීම සඳහා විදේශ මුදල් නොමැතිවීම හේතුවෙන් ගිවිසුම්/ඇණවුම් වටිනාකම රු.528,005,056 ක්වූ විදේශ මිලදී ගැනීම් අයිතම 16 ක් මිලදී ගැනීමට නොහැකිවී තිබුණි. | ණයවර ලිපි විවෘත කිරීම සඳහා විදේශ මුදල් නොමැතිවීම හා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් මිළදී ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත. | අවශ්‍ය ප්‍රතිපාදන පිළිබඳ අවධානය යොමුකර කටයුතු කළ යුතු බව. |
| (ආ) | තොග සැපයීමට සැපයුම්කරු අපොහොසත් විම හා අවසන් බිල්පත නිරවුල් නොකිරීම හේතු කොටගෙන ඇණවුම් වටිනාකම රු.237,472,647 ක්වූ නිල ඇඳුම් නියමිත දිනට සපයා නොතිබුණි. | නියමිත දිනට තොග සැපයීමට සැපයුම්කරු අපොහොසත් විම,තොග සැපයිය යුතු කාලය දීර්ඝ කිරීම හා අවසන් බිල්පත නිරවුල් නොකිරීම යන හේතුන්මත නිළ ඇඳුම් නියමිත දිනට සැපයීමට නොහැකි විය. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උතුරු නාවික විධානය විසින් රු.8,184,704 ක් දරා ඇති ඌරණී ධීවර වරායේ දියකඩනය ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණි. | ඌරණී ධීවර වරායේ දියකඩනය ඉදිකිරීමේ ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දිස්ත්‍රික් ලේකම් දැනුවත් කර ඉතිරි මුදල නැවත ගෙවීමට පියවර ගෙන ඇත. | මහජන මුදල් ඉතාමත් ආර්ථික හා අරපිරිමැසුම් භාවයකින් යුතුව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දින වන විටත් අළුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබූ යාත්‍රා/ නෞකා ප්‍රමාණය 09 ක්වී තිබුණු අතර කාලය මාස 05 සිට මාස 17 ද ඉක්මවා තිබුණි. | අළුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් ඇණවුම්කර ඇති අතර අළුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතී. | කඩිනමින් අළුත්වැඩියාවන් නිමකර භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ආ) | නිශ්කාර්යව පවතින වර්ග අඩි 16,609.5 ක්වූ ගොඩනැගිලි පවරාගැනීමේ කටයුතු මේ දක්වාම අවසන්වී නොතිබුණු අතර කාලය වර්ෂ 05 ද ඉක්මවා තිබුණි. | පවරා ගැනීමේ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී. | නියමිත පරිදි පවරාගැනීමට අවශ්‍ය කටයුතු කඩිනම් කළ යුතු බව. |
| (ඇ) | නාවික හමුදාවට අයත් මෝටර් වාහන 13 ක් බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබුණි. | තාවකාලික පදනමින් ලබා දී ඇත. | බාහිර පාර්ශවයන් වෙත ලබාදී ඇති සම්පත් නැවත ලබාගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) | ලංකා විදුලිබල මණ්ඩලයට අයත් වර්ග අඩි 25,502 ක්වූ ගොඩනැගිලි වර්ෂ 05 ක කාලයක සිට පවරාගැනීමේ කටයුතු අවසන්වී නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු තවදුරටත් සිදු කරමින් පවතී. | නියමිත පරිදි පවරාගැනීම් කටයුතු සිදුකළ යුතු බව. |
| (ඉ) | වයඹ නාවික විධානය සතු අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන ලෙස හඳුනාගෙන ඇති වාහන 07 ක් සඳහා සුදුස්සක් කිරීමට නිර්දේශ කර තිබුණද ඊට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන 07 ක් සම්බන්ධයෙන් සුදුස්සක් කිරීම සඳහා නාවික හමුදා මූලස්ථානය දැනුවත් කර ඇත. | අළුතිවැඩියා කිරීම් ඵලදායී නොවන වත්කම් සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඊ) | ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පරිහරණය කරනු ලබන වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු ඉඩම්වල ප්‍රමාණය හෙක්ටයාර් 435.4223 ක්වූ අතර එම ඉඩම් පරිහරණය කිරීම සඳහා විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබුණි. සමහර ඉඩම් පරිහරණය කර තිබූ කාලය වසර 08,14 හා 22 ද ඉක්මවා තිබුණි. | විධිමත් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් පරිහරණය කිරීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතීන් ලබාගත යුතු බව. |

**3.4 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 05 කට පෙර වෙඩි බෙහෙත් ගබඩාව තුළ සිදුවූ රු. 8,314,236 ක මූල්‍ය විෂමතාවය සම්බන්ධයෙන් ආරම්භ කරනලද විමර්ශන කටයුතු මේ දක්වාම අවසන් වී නොතිබුණි. | නඩු විභාගය 2022 ජුනි මස 24 වන දින නැවත කැඳවීමට නියමිතව ඇත. | විමර්ශන කටයුතු කඩිනම් කර අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් නීතිවිරෝධි පුපුරණ ද්‍රව්‍ය ළඟතබා ගැනීම පිළිබඳ සොයාගැනීමේදී අත්අඩංගුවට ගන්නාලද වෝටර් ජෙල් 41.012 ක් හා ප්ලේන් ඩෙටනේටර් ඒකක 542 ක් ශ්‍රී ලංකා පොලිසිය වෙත භාරදීම සම්බන්ධයෙන්වූ පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි. | පසු විපරම් වාර්තා ලබා ගැනීමට අදාල පොලිස් ස්ථානය හෝ ධීවර පරීක්ෂක කාර්යාලය සමඟ සම්බන්ධීකරණය වන ලෙස උපදෙස් ලබා දී ඇත. | පොලිසිය වෙත ලබා දෙන අත්අඩංගුවට ගත් නීති විරෝධි පුපුරණ ද්‍රව්‍ය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් කළ යුතු බව. |
| (ඇ) | නියමිත කාලසීමාව තුළදී ලැබී ඇති විදුලි බිල්පත් නිරවුල් නොකිරීම හේතුවෙන් රු.685,792 ක් අධිභාර ලෙස ගෙවීමට සිදුවී තිබුණි. | අදාල නොවේ. | අධිභාර ගෙවීමට නොහැකි වන අයුරින් ගෙවීමට ඇති නියමිත ගාස්තු නියමිත කාලය තුළ ගෙවීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) | නාවික හමුදාව සඳහා අවශ්‍ය ඖෂධ අවශ්‍යතාවය වෛද්‍ය සැපයීම් අංශය මගින් මිලදීගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි අනුමැතිය ලබාගෙන තිබියදී ඉහළ මිල ගණන් යටතේ දේශීය සැපයුම්කරුවන්ගෙන් එම ඖෂධ අවශ්‍යතාවය ලබාගැනීමට කටයුතු කිරීම හේතුවෙන් රු.33,400,776 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට පරීක්ෂණ මණ්ඩලයක් සහ අධ්‍යයන මණ්ඩලයක් පත් කර ඇති අතර එම මණ්ඩලයන් විසින් ලබා දෙනු ලබන නිර්දේශයන්ට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | හැකි සෑම අවස්ථාවකම වෛද්‍ය සැපයුම් අංශයෙන් අවශ්‍ය පහසුකම් ලබාගැනීමට කටයුතු කළ යුතු බව. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීම සඳහා ඉලක්ක 11 ක් හඳුනාගෙන තිබුණද ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ළඟාකරගන්නා ආකාරය පිළිබඳ ප්‍රතිශතාත්මක ඇගයීමක් සිදුකිරීම ප්‍රායෝගිකව දුෂ්කර වී තිබුණි. | සපුරාගත යුතු ඉලක්ක සම්බන්ධයෙන් අදාල අංශ ඇනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුණු සපුරාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සිවිල් කාර්ය මණ්ඩලය තුළ ප්‍රාථමික, ද්විතියික හා තෘතියික මට්ටමේ තනතුරු **487** ක් එනම් සියයට **25** ක් පුරප්පාඩු වී තිබුණි. | බඳවා ගැනීම් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇති බැවින් නාවික හමුදා සිවිල් කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සඳහා කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට නොහැකි වී ඇත. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |
| (ආ) | නාවික නිලධාරින් හා නාවික තනතුරු පිළිවෙලින් **256** ක් හා **6102** ක් පුරප්පාඩු වී තිබුණි. එය සියයට **7** ක් හා **12** ක් වී තිබුණි. | මෙම පුරප්පාඩු ඉදිරි වර්ෂයන් තුල පිරවීමට කටයුතු කරනු ලබයි. | -එම- |